## පරිගණකයට සිංහල අකුරු ගෙනාවේ කවිද

# මහාචාර්ය සමරනායක ගැන දුර්මත දොඩා ඔහුට අගෞරව නොකරන්න

විමල් ධීරසේකර විසිනි

මෙරට තොරතුරු තාක්ෂණය වෙනුවෙන් විශාල මෙහෙයක් සිදුකළ මහාචාර්ය වී.කේ. සමරනායක මහතා අභාවප්‍රාප්ත වීය. ජූනි දෙවෙනි දා ඔහුගේ අවමංගල කටයුතු රාජ්‍ය ගෞරව මැද සිදුකෙරුණි. ඔහු කළ සේවාව අගයමින් බොහෝ මාධ්‍ය බොහෝ දෑ පළ කර ඇත. මෙම ලියුම්කරුද ඔහුගේ සේවාව මින් පසු ශ්‍රී ලංකාවට නොලැබීම ගැන අතිශයින් කණගාටු වෙයි.

මේ අතර සමරනායක වියතානන් පිළිබඳ ඔහුගේ ගෝල බාලයන් කියන කරන දෑ සම්බන්ධයෙන් අපට සම්පූර්ණයෙන්ම එකඟ විය නොහැක. ඔහු නොකළ දෑ පවා ඔහු විසින් කරන ලදැයි පැවසීමෙන් සිදුවනුයේ සැබෑ වශයෙන්ම ඔහුගේ සේවාව අගෞරවයට පත්කිරීමකි. කවුරුවත් කරන ලද දෑ සමරනායක මහතා වෙත පැටවීම ඔහුවත් අනුමත නොකරනු ඇත.

මේ ලිපියේ අරමුණ සමරනායක මහතාගේ ගෝලයින් සහ නොදන්නා කම නිසාදෝ බොහෝ මාධ්‍ය මගින් කරනා කරුණු විකෘති කිරීමක් නිවැරදි කිරීමයි.

එනම් පරිගණකයට සිංහල මුසුකෙළේ සමරනායක මහතාය යන අසත්‍ය සහගත ප්‍රචාරයයි. අද දින උදෑසන එක් පෞද්ගලික රූපවාහිනී නාලිකාවකට පැමිණි සමරනායක මහතාගේ ගෝලයෙකු ද පුන පුනා මෙම අසත්‍යය ප්‍රචාරය කරනු මෙම ලියුම්කරු අසා සිටියේය. මෙම අසත්‍ය කථාව අගමැතිවරයා නිකුත් කරන ලද ශෝක නිවේදනයේද සඳහන් වේ.

මෙය කුමන පදනමකින් මෙම කණ්ඩායම් ගෙන යනවාදැයි අප නොදන්නා නමුත් සිංහල භාෂාව පරිගණකයට ඒමේ නිධාන කථාවේ සිටි ප්‍රධාන පුද්ගලයින්ට මෙමගින් කිසියම් අසාධාරනයක් සිදුවීම වලකාලනු වස් සැකැවින් මෙහි සටහන් කර තැබීම සමරනායක මහතාට කරන සැබෑ ගෞරවයක් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

පළමුවෙන්ම 70 දශකයේ 'දිවයින' පුවත් පත ආරම්භයේදී ඒ සඳහා පරිගණක අක්ෂර භාවිතා කරන ලද අතර එය එතරම් සාර්ථක අක්ෂරයක් නොවූ අතර එම දශකයේ අවසානයේ දී 'අයිබීඑම්' පරිගණක සඳහා 'ඩොස්' මෙහෙයුම් පද්ධතිය භාවිතා කරමින් සිංහල අකුරක් 'තිබස්' නමින් නිපදවූයේ මහරගම මහානාම මහතායි. පසුව 80 දශකයේ මුල් කාලයේ ඇපල් පරිගණකය බිහිවීමත් සමග එම මෙහෙයුම් පද්ධතිය භාවිතා කරමින් සිංහල අකුරු නිපදවූයේ විජය ග්‍රැෆික්ස් ආයතනය වන අතර ඊට මුල්වූයේ රවි පීරිස් සහ සමරකෝන් මහත්වරුන්ය. ඔවුන් අනුරාධා, නෙළුම්, මානෙල් නමින් වඩාත් ප්‍රසිද්ධ නිවැරදි අකුරු කාණ්ඩ තුනක් නිපදවූ අතර එහිදී වඩා වැදගත් වන සිංහල අකුරු 'ලින්ක්' කිරීම සඳහා අවශ්‍ය ගොනුව ලංකාවේ අප වෙත සපයා දුන්නේ තමිල්නාඩුවෙන් බව විජය ග්‍රැෆික්ස් ආයතනය සාක්ෂි දරනවා ඇත. එය ඇපල් පරිගණක සඳහා 'ටැමිල් කේබීඩී' ගොනුවට සමානව සැකසූ 'සිංහල කේබීඩී' ගොනුවයි. ඉන්පසුව ඇපල්



පරිගණක සඳහා 'ඩිසයින් සිස්ටම්' ආයතනය ද 'රිද්ම' නමින් අකුරු කාණ්ඩයක් නිපදවූ අතර ලංකාවේ ප්‍රථමයෙන්ම පේටන්ට් අයිතිය ලබා ගත් අකුර වූයේ 'රිද්ම' වන අතර එය නිපදවූයේ අරුණ වික්‍රමාරච්චි මහතායි.

ඉන් පසුව 90 දශකයේ මුල් කාලයේ දී පරිගණක ක්ෂේත්‍රයේ විප්ලවයක් වන්නේ අයිබීඑම් පරිඝණක සඳහා වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය මයික්‍රොසොෆ්ට් ආයතනය විසින් හඳුන්වාදීමයි. වින්ඩෝස් 3.0 ආරම්භක පද්ධතිය නිකුත් වනවාත් සමගම ප්‍රථමයෙන්ම එයට ගැලපෙන ලෙසත් විජේසේකර යතුරු පුවරුවට සරිලන ලෙසත් 'සන්ධ්‍යා' නමින් අකුරක් නිපදවූයේ 'මයික්‍රෝ ඇන්ඩ් වේ - ෆොන්ට් බෑන්ක්' නම් ආයනය පවත්වාගෙන ගිය ඩී.පී. එස්. සේනාධීර සහ කෝලිත දිසානායක මහත්වරුන් ය. ඔවුන්ගේ එම අක්ෂරය නිපදවීමට රුසියාවේ සිට පැමිණි සොලමන්ස් බණ්ඩාරනායක නම් මහතකුද වින්ඩෝස් සඳහා අත්‍යවශ්‍ය වන 'ලින්ක්' ගොනුව නිර්මාණය කිරීමට උදව් විය. මෙම ප්‍රථම වින්ඩෝස් අක්ෂරය මහවැලිය, වරාය, ඉසුරුපාය, බීඕඅයි වැනි රාජ්‍ය ආයතන වල තවමත් භාවිතා වේ.
මහානාම මහතාද සිය අකුර වින්ඩෝස් සඳහා තව දුරටත් වැඩි දියුණු කරන ලද වුවත් විජේසේකර යතුරු පුවරුව හා ගැලපීමේදී ආබාධ තිබිණ. මුල් ගල් තැබූවෙකු නොවූවද පරිගණකයේ සිංහල අක්ෂරයන් සුමට සහ විචිත්‍රවත් කෙළේ 'ද ෆොන්ට් මාස්ටර්' ආයතනය සහ පුෂ්පානන්ද ඒකනායක මහතායි.

ඉන්පසුව වඩාත් වැදගත් වන්නේ 90 දශකයේ අග භාගයේදී අන්තර් ජාලය සඳහා සිංහල අක්ෂරයක් නිපදවීමයි. එය ප්‍රථමයෙන්ම නිපදවන ලද්දේ 'කපුටා ඩොට් කොම්' ආයතනයයි. නමුත් එය භාවිතාවේ දී විජේසේකර යතුරු පුවරුව හා නොගැලපුනා පමණක් නොව ඉස්පිලි පාපිලි භාවිතයේදී ද නිවැරදි නොවුණි. ඊට පසුව 2005 දී භාවිතා කරන්නන්ට පහසු වූ විජේසේකර යතුරු පුවරුවට ද සරිලන ඉස්පිලි පාපිලි නිවැරදි වූ මේ ඔබ කියවන අක්ෂරය බිහිකලේ 'ලංකා ඊ නිවුස්' ආයතනයයි. මේ සඳහා වෙහෙසුණේ ඩී.පී.එස් සේනාධීර සහ චානක ජයසේන මහත්වරුන්ය. එය අද රජයේ මාධ්‍ය මධ්‍යස්ථානය ඇතුළු බොහෝ වෙබ් අඩවි සිය භාවිතාව සඳහා යොදාගෙන ඇත.

සමරනායක මහතා පරිගණකයේ සිංහල සම්බන්ධයෙන් යම් කරුණක් ඉෂ්ඨ සිද්ධ කෙළේය. එනම් 'සිංහල යුනිකෝඩ්' අක්ෂරයක් නිපැදවීමයි. ඔහුගේ මග පෙන්වීමෙන් 'අයිසීටීඒ' ආයතනය ලක්ෂ 600 ක් වැනි විශාල මුදලක් වියදම් කර එය නිපැයූවද බොහෝ මෙහෙයුම් පද්ධති සඳහා එය හරියාකාරව ක්‍රියා නොකරයි.

සිංහලය පරිගණකයට මුසු කිරීමේ අටුවා කථාව එසේය. ගෝලයින් පවසන පරිදි සමරනායක මහතා සිංහලය පරිගණකයට මුසු කිරීමේ ආරම්භක කාර්ය භාරයක් සිදුකෙළේ නැත. එසේ කළා නම් එය කුමක්දැයි? අද එය භාවිතා කරන්නේ කොහේදැයි? පෙන්වා දෙන මෙන් අපි කරුණාවෙන් ඉල්ලා සිටිමු.

සමරනායක මහතා තොරතුරු තාක්ෂණයේ වෙනත් ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ කාර්ය භාරයක් ඉටු කෙළේය. මැතිවරණ ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුත්ත, ගමට පරිගණක තාක්ෂණය ගෙන යෑම, පරිගණක සඳහා බදු ඉවත් කර ගැනීමට කටයුතු කිරීම ඇතුළු බොහෝ දෑ ඔහුගේ මග පෙන්වීම් මත සිදුකරන ලද අතර ඔහු ලංකාවේ නොමැකෙන සනිටුහනක් තබා ඇත. අප මෙහිදී පෙන්වා දුන්නේ ඔහු නොකරන ලද දෙයක් ඔහු විසින් කරන ලදැයි කීමෙන් ඔහුටත්, එම කටයුත්තට සැබෑ ලෙස දායක වූ අනෙක් සුධීමතුන්ටත් ඇතිවන හානිය අවම කිරීම සඳහා පමණි.

මහාචාර්ය සමරනායකයන්ට නිවන් සැප ප්‍රාර්ථනා කරමු.

ලංකා ඊනිව්ස් අනුග්‍රහයෙනි




## අනාගත වෛද්‍ය විද්‍යාවේ පෙරළිය

එංගලන්තයේ යැසෙකා විශ්ව විද්‍යාලයේ විද්‍යාඥයෝ පිරිසක් කෘතිම රුධිරය සොයාගැනීමට සමත් වූහ.

අපේ රුධිරය පාරවිලනය සඳහා ඇති ගැටළු

- අදාල රුධිර කාණ්ඩය සොයා ගැනීමට ඇති අපහසුව
- "Aids" වැනි වෛරස රුධිරයේ සැඟවී තිබීම
- ආගමික විශ්වාස
- ගබඩා කිරීමේ අපහසුව

**විසඳුම - ප්ලාස්ටික් රුධිරය**

- ස්වාභාවික රුධිරය මෙන් ආසාදන වලට ලක්නොවීම
- ප්‍රවාහනය කිරීමේ පහසුව
- නිෂ්පාදන වියදම අවම වීම
- කාමර උෂ්ණත්වය යටතේ ගබඩා කළ හැකි වීම
- රැගෙන යාමේ පහසුව

Sheffield විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබද මහාචාර්ය ' ලාන්ස් ටයිමන් ' මෙම සොයා ගැනීම පිළිබඳව මෙසේ අදහස් දක්වයි :
' මෙම නිෂ්පාදනය ගැන ඇත්තටම අපි පුදුම වුණා. අපට මෙයින් ජීවිත රැසක්ම රැකගන්නට පුළුවනි.' මෙම ප්ලාස්ටික් රුධිරය ශරීරයට ඇතුල්වූ සැනින් මුළුමනින්ම ස්වාභාවික රුධිරය බවට පත්වන අතර එය ශරීරයේම කොටසක් බවට පත්වේ.

මෙම රුධිරය නිපදවා ගැනීමෙන් පසුව පලමුවම සතුන් ඇසුරෙන්ද පසුව ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ පුද්ගලයන් ඇසුරෙන්ද මේ රුධිරයේ සාර්ථකත්වය පිළිබදව පර්යේෂණ සිදුකොට ඇත.
මේ අනුව අනාගතයේදී වෛද්‍ය විද්‍යාවේ විශාල පෙරලියක් අපේක්ෂා කළ හැකි ය.

ගාමිණී පැලැන්ද

## ලොව අසම සම පුවත්පත් කලාවේදියා

මා මේ කථා කරන්නේ ලෝක ප්‍රකට පුවත් පත් කලා වේදියෙකු ගැනයි. මෙය වර්තමාන යුගයට බෙහෙවින් ගැලපෙන බව සිතේ.
'' නිව්යෝක් ටයිම්ස් '' පුවත් පතේ විදේශ ප්‍රවෘත්ති වාර්තා කරුවෙකු ලෙස වසර 30 ක් පටන් සේවය කරන '' තෝමස්.ජේ.ෆ්‍රීඩ්ස්මන් '' වූ සුවිශේෂ ජනමාධ්‍ය ශිල්පියා ක්ෂේත්‍රය තුල වඩාත් කීර්තියට පත්වී සිටී. ඔහුගේ වැඩි කාළයක් ගත වන්නේ ගුවන් යානා තුලය. රටින් රට ගොස් අදාල ප්‍රවෘත්ති ඒ ස්ථානයේ සිටම වාර්තා කිරීම ඔහුට පැවරුණු කාර්යයි. සමහර විට මෙම වාර්තා රණබිමේ සිට සිදුවන අතර තවත් විටෙක උණුසුම් මැතිවරණ භූමියක සිට සිදුවෙයි. ඔහු ලෝකයේ නොගිය රටවල් ඇත්තේ අතලොස්සකි. ඔහු ශ්‍රී ලංකාවටද පැමිණ ඇත.

ගුවන් යානා මගියෙකුට ලැබෙන ඉහලම ප්ලැටිනම් සාමාජිකත්වය තෝමස්ට හිමිවූයේ 1990 වන විටය. ඒ වන විට ඔහු ගුවන් සැතපුම් 70 000 ක් චාරිකා කර තිබුණි. 1990 සිට අදවන විට ඔහුගේ චාරිකා ගුවන් සැතපුම් 100 000 ක් පමණ නිමවී ඇතත් ඔහුට පිරිනැමීමට හැකි සුපිරි සාමාජිකත්වයක් නැත.

ඔහුගේ චාරිකා වලදී වැඩියෙන් මුණ ගැසෙන්නේ රජවරුන් ජනාධිපතිවරුන් අගමැතිවරුන් සහ සුපිරි නිලධාරින්ය.

සමහර විට තෝමස් එක රටක උදේ ආහාරය ගෙන තවත් රටක දහවල් ආහාරයට ගොස් රාත්‍රී ආහාරය වෙනත් රටකටද ගුවන් යානයක නිදාගෙන පසුදා පාන්දර වෙනත් රටකට ලඟාවෙයි. මේ අතර තුල තමා කළ සියලු කටයුතු හා ප්‍රධාන වාර්තා ඊ මේල් මගින් සහ දුරකථන මගින් තම පුවත් පතට ලැබෙන්නට සැලැස්වීම ඔහුට පැවරී ඇති වගකීමයි.

ඇමරිකාව වැනි රටක පුවත්පත් කලාවට අදාල උසස්ම සම්මානය ලබා ගැනීම පහසු කටයුත්තක් නොවේ. නමුත් 1983 සහ 1988 දීත් ඔහු එම සම්මානය හිමි කරගත්තේය. 2002 වසරේ දී ඇමරිකාවේ විශිෂ්ට පුවත්පත් කලාවේදියාට පුදන සම්මානයෙන් ඔහු පිදුම් ලැබීය.

වයස අවුරුදු 53 ක් වන ඔහු ඉතාම හොඳ සැමියෙකි. කොතරම් වැඩ තිබුණත් මා දවසට කිහිපවතාවක් බිරිඳට කතා කරනවා. පිහිනීම මගේ විනෝදාංශයයි. ආහාර සඳහා මස් කන්නේ ඉතාම අඩුවෙන් ඔහු පවසා තිබේ.

ඇමරිකාවේ වොෂින්ටන් නුවර මේරි ලෑන්ඩ් නගරයේ පදිංචි මේ පරිනත චරිතවත් මාධ්‍යවේදියා සකල පුවත් කලාවටම ආඩම්බරයකි.